# ලංසු කැඳවීම
# සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
# වාර්ෂික අවශ්‍යතා ප්‍රසම්පාදනය - 2022
# ලංසු අංකය : SD/IV/2022

01. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2022 වාර්ෂික අවශ්‍යතා ප්‍රසම්පාදනයට අදාලව පහත සේවාව ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා සහිත ලංසු ඉදිරිපත් කිරීමට කරනු ලබන ආරාධනයයි.

| අනු අංකය | විස්තරය | ලංසු සුරක්ෂණ (රු.) |
|---|---|---|
| 01 | සර්වේයර් ජනරාල් කාර්යාලය සඳහා ආරක්ෂක සේවය ලබා ගැනීම (වසරක කාලයක් සඳහා) | 100,000.00 |

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මත සිදු කෙරේ.

03. ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසු තබන්නන් හට සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් කාර්යාල වේලාවන් තුල ලංසු කැඳවීමේ ලිපි ලේඛන පරීක්ෂා කළ හැකි අතර දුරකථන අංක 011-2368106 ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

04. පූර්ව ලංසු රැස්වීම 2022.09.07 දින පෙ.ව 10.00 ට දෙපාර්තුමේන්තු පැරණි ශ්‍රවනාගාරයේ පැවැත්වේ.

05. ලංසු කැඳවීමේ සම්පූර්ණ ලේඛන කට්ටලයක්, අයදුම්පතක් හා රුපියල් දෙදහසක (රු.2000.00) නැවත නොගෙවන මුදලින් කරනු ලබන ගෙවීම් මත 2022.09.21 වන දින ප.ව.02.30 දක්වා වූ කාර්යාල වේලාවන් තුල ලංසු තබන්නන්ට සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබා ගත හැකිය.

06. සකස් කල ලංසු පත්‍ර (පිටපත් දෙකකින් යුක්ත විය යුතුය) ඇතුලත් කරන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයිතමය සඳහන් කර මුද්‍රා තැබූ ලිපි කවර 2022.09.22 වන දින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) ,මිනින්දෝරු දෙපාර්තමේන්තුව , අංක 150, කිරුළ පාර,නාරාහේන්පිට,කොළඹ 05 ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2022.09.22 වන දින පෙ.ව. 11.05 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේදී මිල ගණන් විවෘත කරනු ලබන අතර , මිල ගණන් ඉදිරිපත් කළ අය හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතවරයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැක. සියලුම ලංසු ඉහත උපලේඛනයෙහි සඳහන් ලංසු සුරකුම් ගාස්තු වලින් සමන්විත විය යුතුය.

සර්වේයර් ජනරාල්
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
අංක 150, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.
2022.08.19